# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,324 - 2023 මාර්තු මස 17 වැනි සිකුරාදා - 2023.03.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 82 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 අප්‍රේල් මස 06 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 මාර්තු මස 24 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය.''**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


81- B 082437 — 353 (2023/03)
D 1 -

# විවිධ දැන්වීම්

**සිවිල් (වාණිජ) අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය.**

කොළඹ 02, හුණුපිටිය වැව පාර, අංක 117/10 හි පිහිටි වොයිස් ඔෆ් ඒෂියා නෙට්වර්ක් (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධ කාරණාවේ දී ය.

සහ

ගණන් බේරා වසා දැමීමේ ඉල්ලීම් අංක : 9/2023/CO

2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීමක් පිළිබඳ කාරණයේ දී ය.

ඩී. එෆ්. සී. සී. බැන්ක් පීඑල්සී,
අංක 73/5, ගාලු පාර, කොළඹ 03.
සහ
අංක 73, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02

පෙත්සම්කරු

කොළඹ දී නඩු විභාග කරන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී,
අංක 73/5, ගාලු පාර, කොළඹ 03.
සහ
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

විසින් 2023 පෙබරවාරි මස 9 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එකී පෙත්සම 2023 මැයි මස 23 වැනි දින එකී අධිකරණය ඉදිරියේ ඇසිය යුතු බවට නියම කර ඇති බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීමට සහයෝගය හෝ විරෝධය හෝ දැක්වීමට කැමති එකී සමාගමේ යම් ණය හිමියෙකු හෝ දායකයෙකු එකී පෙත්සම අසන වේලාවේ දී පුද්ගලිකව හෝ අධිනීතිඥ මහතෙකු හෝ ලේඛනගත නීතිඥයෙකු මගින් එම අරමුණ වෙනුවෙන් පෙනී සිටීමට හැකි බව මෙයින් දන්වනු ලැබේ. තවද, පෙත්සමේ පිටපතක් ඒ සඳහා නියමකර ඇති ගාස්තු ගෙවීම මත එය අවශ්‍ය වන සමාගමේ යම් ණය හිමියෙකුට හෝ දායකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන්නේ ය.

නීතිඥ තේජක පෙරේරා,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02

සටහන :- එකී පෙත්සම ඇසීමේ දී පෙනී සිටීමට අදහස් කරන යම් පුද්ගලයෙකු, එසේ කිරීමට ඇති ඔහුගේ/ඇයගේ/එහි අදහස්, ඉහත නම සඳහන් නීතිඥ තේජක පෙරේරා යන අය වෙත ලිඛිතව භාරදීම හෝ තැපැල් මගින් එවීම කළ යුතුය. පුද්ගලයින්ගේ නම් සහ ලිපිනය හෝ යම් ව්‍යාපාරයක් නම් එහි නම සහ ලිපිනය හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛනගත නීතිඥයින් ඇත්නම් ලේඛනගත නීතිඥවරයාගේ නම සහ ලිපිනය නොතීසියේ සඳහන් කිරීම අවශ්‍ය වන අතර, එය 2023 මැයි මස 22 වැනි දින පස්වරු 6.00ට පෙර ඉහත නම සඳහන් අයවලුන්ට ලැබෙන සේ කල් වේලා ඇතිව භාර කිරීම හෝ තැපැල් කරනුයේ නම්, එසේ තැපැල් කිරීම අවශ්‍ය වේ.

නීතිඥ තේජක පෙරේරා,
පෙත්සම්කරුගේ නීතිඥ.

03-229

---

**(සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන) බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය.**

නඩු අංකය : CHC/16/2022/CO
ස්වභාවය : ඈවර කිරීම

2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ කොළඹ 07, ග්‍රෙගරීස් පාර, අංක 67A හි පිහිටි, සමාගම් ලියාපදිංචි කිරීමේ අංක PV 121730 දරන ඔපෝර්ටෝ ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් නම් සමාගම ගරු අධිකරණය විසින් ඈවරකරනු ලැබීම සඳහා වූ ඉල්ලීම සම්බන්ධයෙන් වන කාරණයේ දී ය.

ස්ටැසන් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 833,
සිරිමාවෝ බණ්ඩාරනායක මාවත,
තැ. පෙ. 1970, කොළඹ 14.

*පෙත්සම්කරු*

බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක්, වර්ෂ 2022ක් වූ මාර්තු මස 30 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ කේ. උපේන්ද්‍ර ගුණසේකර විසින් ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම වර්ෂ 2023ක් වූ මැයි මස 22 වැනි දින අධිකරණය ඉදිරියෙ හි විමසීමට නියම කර ඇති බවද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධ වීමට හෝ කැමති එකී සමාගමේ කිසියම් ණය හිමියෙකු හෝ සහදායකයකු වේ නම් ඒ තැනැත්තාට තත්කාර්ය සඳහා එය

විමසීමට ලක් කරන අවස්ථාවෙ හි පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටිය හැකි බවද, පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ සහදායකයකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බවද, මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. උපේන්ද්‍ර ගුණසේකර,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 135 - 1/3, ගුණසිංහපුර කාර්යාල සංකීර්ණය,
ශාන්ත සෙබස්තියන් වීදිය,
කොළඹ 12.

*සටහන* :

එකී පෙත්සම විමසීමට ලක් කරන අවස්ථාවෙ හි පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තෙකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් නීතිඥ කේ. උපේන්ද්‍ර ගුණසේකර වෙත භාර දිය යුතුය. නැතහොත් තැපෑලෙන් එවිය යුතුය. එම දැන්වීමෙහි එම තැනැත්තාගේ නම සහ ලිපිනය ද, ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතු අතර, එය එම තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු වෙතොත්) එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන්ම 2023 ක් වූ මැයි මස 21 වැනි දින සවස 06 ට පෙර ලැබෙන ලෙස භාර දිය යුතුය. නැතහොත් තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වෙලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතිව තැපැල් කළ යුතුය.

03-230

---

**(සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන) බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය.**

2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ කොළඹ 13, ජෝජ්. ආර්. ද සිල්වා මාවත, අංක 297/2 හි, සමාගම් ලියාපදිංචි කිරීමේ අංක PV 1335 දරන ඊස්ට් වෙස්ට් මාකටින් (ප්‍රයිවට්) ලිමිටඩ් නම් සමාගම ගරු අධිකරණය විසින් ඈවර කරනු ලැබීම සඳහා වූ ඉල්ලීම සම්බන්ධයෙන් වන කාරණයේ දී ය.

නඩු අංකය :
CHC/54/2022/CO
ස්වභාවය : ඈවර කිරීම

සී. ඩී. ද ෆොන්සේකා ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 37, එළුවිල,
පානදුර

*පෙත්සම්කරු*

බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ණයන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක්, වර්ෂ 2022ක් වූ නොවැම්බර් මස 14 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ ජේ. සජුනි සෙනෙවිරත්න විසින් ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම වර්ෂ 2023ක් වූ අප්‍රේල් මස 03 වැනි දින අධිකරණය ඉදිරියෙහි විමසීමට නියම කර ඇති බවද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධ වීමට හෝ කැමති එකී සමාගමේ කිසියම් ණය හිමියෙකු හෝ සහදායකයකු වේ නම් ඒ තැනැත්තාට තත් කාර්ය සඳහා එය විමසීමට ලක් කරන අවස්ථාවෙහි පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටිය හැකි බවද, පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ සහදායකයකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බවද, මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජේ. සජුනි සෙනෙවිරත්න,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 391-2/2,
වේල්ල වීදිය,
කොළඹ 12.

*සටහන* :

එකී පෙත්සම විමසීමට ලක් කරන අවස්ථාවෙහි පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තෙකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් නීතිඥ ජේ. සජුනි සෙනෙවිරත්න වෙත භාර දිය යුතුය. නැතහොත් තැපෑලෙන් එවිය යුතුය. එම දැන්වීමෙහි එම තැනැත්තාගේ නම සහ ලිපිනය ද, ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතු අතර, එය එම තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු වෙතොත්) එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන්ම 2023 ක් වූ අප්‍රේල් මස 02 වැනි දින සවස 06 ට පෙර ලැබෙන ලෙස භාර දිය යුතුය. නැතහොත් තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වෙලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතිව තැපැල් කළ යුතුය.

03-231/1

---

**(සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන) බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය.**

2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ කොළඹ 13, ජෝජ්. ආර්. ද සිල්වා මාවත, අංක 297/2 හි, සමාගම් ලියාපදිංචි කිරීමේ අංක PV 1335 දරන ඊස්ට් වෙස්ට් මාකටින් (ප්‍රයිවට්) ලිමිටඩ් නම් සමාගම ගරු අධිකරණය විසින් ඈවරකරනු ලැබීම සඳහා වූ ඉල්ලීම සම්බන්ධයෙන් වන කාරණයේ දී ය.

නඩු අංකය :
CHC/55/2022/CO
ස්වභාවය : ඈවර කිරීම

සී. ඩී. ඩී. ඊ. එෆ් මැනුෆැක්චරර්ස් ඇන්ඩ් මර්චන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 37, එළුවිල,
පානදුර

*පෙත්සම්කරු*

බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක්, වර්ෂ 2022ක් වූ නොවැම්බර් මස 14 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ ජේ. සජුනි සෙනෙවිරත්න විසින් ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම වර්ෂ 2023ක් වූ අප්‍රේල් මස 03 වැනි දින අධිකරණය ඉදිරියෙහි විමසීමට නියම කර ඇති බවද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධ වීමට හෝ කැමති එකී සමාගමේ කිසියම් ණය හිමියෙකු හෝ සහදායකයකු වේ නම් ඒ තැනැත්තාට තත් කාර්ය සඳහා එය විමසීමට ලක් කරන අවස්ථාවෙහි පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටිය හැකි බවද, පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ සහදායකයකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බවද, මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජේ. සජුනි සෙනෙවිරත්න,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 391-2/2,
වේල්ල වීදිය,
කොළඹ 12.

*සටහන* :

එකී පෙත්සම විමසීමට ලක් කරන අවස්ථාවෙහි පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තෙකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් නීතිඥ ජේ. සජුනි සෙනෙවිරත්න වෙත භාර දිය යුතුය. නැතහොත් තැපෑලෙන් එවිය යුතුය. එම දැන්වීමෙහි එම තැනැත්තාගේ නම සහ ලිපිනය ද, ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතු අතර, එය එම තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු වෙතොත්) එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන්ම 2023 ක් වූ අප්‍රේල් මස 02 වැනි දින සවස 06 ට පෙර ලැබෙන ලෙස භාර දිය යුතුය. නැතහොත් තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වෙලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතිව තැපැල් කළ යුතුය.

03-231/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.